**#MediaEthicsSL #TamilPress #Ika #Thinakkural #November12**

"කම්පනය හෝ හිත් වේදනා ඇතිකරන ආකාරයේ සමාජ ප්‍රශ්න, එනම්, කෲරත්වය, ප්‍රචණ්ඩත්වය, මත්ද්‍රව්‍ය අපයෝජනය, දුෂ්ටත්වය, පරපීඩා කාමුකත්වය, ලිංගික පීඩනය, අශිෂ්ටත්වය යනාදිය පිළිබඳ කරුණු වාර්තා කිරීමේදී ඊට සම්බන්ධ ඡායාරූප හා චිත්‍ර, අවශ්‍ය සංවේදීතාවෙන් හා විචාර බුද්ධියෙන් යුතුව මෙන්ම පොදුජන යහපත උදෙසා කරුණු ප්‍රකාශයට පත් කිරීම පිළිබඳ තමන්ගේ වගකීමට යටත්වද ඉදිරිපත් කිරීමට පුවත්පත විශේෂයෙන් සැලැකිලිමත් විය යුත්තේය" යනුවෙන් ශ්‍රී ලංකා කර්තෘ සංසදය මගින් ප්‍රකාශයට පත් කර ඇති වෘත්තිය ප්‍රතිපත්ති මාලාවේ සඳහන් වෙයි. මෙවැනි අන්තර්ගතයන් පුවත්පත් තුළින් ඉදිරිපත් කිරීම සම්බන්ධව ලෝකයේ වෙනත් රටවලද මීට සමාන ආචාර ධර්මයන් පවතී.

කෙසේ වෙතත් ගැටළුව වන්නේ පුවත්පත් මගින් පළ කරනා ඉහත සඳහන් කොට ඇති ආකාරයේ ඡායාරූප හෝ චිත්‍රයන් සැබවින්ම පළ කිරීම අවශ්‍යද යන්නයි. එම ඡායාරූපයන් හෝ චිත්‍රයන් පළ කිරීම යුක්ති යුක්ත කළ හැක්කේ ඒවා පළ නොකිරීම හරහා ප්‍රවෘත්තියේ හරයට හානියක් සිදුවන්නේ නම් පමණක් නොවේද?

නොවැම්බර් 12 වෙනිදින තිනකුරල් පුවත්පත මගින් පළ කොට තිබූ, මන්නාරමේ සොයාගත් මෘත ශරීරයක සේයාරුව ඉහත මතුකළ කාරණාවට උදාහරණයක් ලෙසින් දැක්විය හැක. මෙම සේයාරුව පළ නොකිරීම හරහා ලිපියේ අන්තර්ගතයට හානියක් සිදු නොවන්නේ නම්, එවැනි සංවේදී දර්ශනයක් පෙන්වා දීම අවශ්‍ය වන්නේද? එසේ නැතිනම් සංවේදී වුවත් එවැනි දර්ශන ලිපියක් හා පළ කළ යුතුයැයි ඔබ සිතන්නේද?

The Code of Professional Practice of the Editors' Guild of Sri Lanka states that "In dealing with social issues of a particularly shocking or emotionally painful nature– such as atrocity, violence, drug abuse, brutality, sadism, sexual salacity and obscenity –the press should take special care to present facts, opinions, photographs and graphics with due sensitivity and discretion, subject to its duty to publish in the public interest." Similarly, ethical codes for media reporting around the world suggests that caution should be used so as to not hurt the feelings of the relatives and sensitiveness of the public when reporting on accidents and events of grief and shock.

However, the Thinakkural newspaper on 12 November 2018 published an article regarding the recovery of a body in Parapukkadanthan in Mannar with a visual illustration. Considering the above mentioned ethical codes, is this illustration appropriate? Is it ethical to publish images such as these? What do you all think?